

# ශ්‍රී ලංකාවේ නීතිය හා නෛතික රමුව හැඳින්වීම

# 1. 1 නීතිය අර්ථනිරූපනය කිරීම.

අද වන විට නීතිය පිලිබදව විවිධ අර්ථකතන පවතී. සමාජයේ විවිධ ලක්ෂණ උපයෝගී කර ගනිමින් ඇතැම් විදයාර්තයන් විවිධ නිර්වචන ඉදිරිපත් කර ඇත.

එලෙස දැක් වූ නිර්වචන කිහිපයක් පහත දැක්වේ.

*ආශාවන්ගෙන් අනුබල නොලත් තාර්කික බුද්ධියේ උත්තරීතර ප්‍රතිපලය නීතිය වේ.*

*-ඇරිස්ටෝටල්-*

*නීතිය යනු රජය විසින් නිර්මාණය කරන ලද අයිතිවාසිකම් හා යුතුකම් සමුදායකි*

*- යථාදෘෂ්ටිකවාදි නීති ගුරු කුලය--*

# 1.1.1 නීතිය වර්ගීකරණය කිරීම.

**- සමාජයක පාලනය හා නිවැරදි දිවිපැවැත්ම වෙනුවෙන් පැනවූ චර්යා පාලනය කල හැකි රීතින් සමූහය** පොදුවේ ගත් කල නීතිය ලෙස නිර්වචනය කල හැක

එම නීතිය ප්‍රධාන කොටස් 4 ක් යටතේ වර්ගීකරනය කරයි.

1. සිවිල් නීතිය හා අපරාධ නීතීය.
2. හරයාත්මක නීතිය හා කර්ය පටිපාටික නීතිය
3. දේශීය නීතිය හා අන්තර්ජාතික නීතිය.
4. පුද්ගල නීතිය හා පොදු නීතිය

# සිවිල් නීතිය හා අපරාධ නීතීය

| සිවිල් නීතිය | අපරධ නීතිය |
| --- | --- |
| සිවිල් වැරදි සම්බන්ධව නඩු සිවිල් අධිකරණවල විසදයි.<br>උදා - දිසා අධිකරණය | අපරාධ වැරදි සම්බන්ධ නඩු අපරාධ අධිකරණය විසදයි.<br>උදා - මහේස්ත්‍රාත් අධිකරනය / මහාධිකරනය. |
| සිවිල් නඩුවක අරමුන හානියට පත් වූවන් යථාවත් කිරීමයි | අපරාධ නඩුවක් මගින් අපරාධකරුවන්ට දඩුවම් ලබා දීම අරමුණු කරයි. |
| සිවිල් නඩුවක පාර්ශව - පමිණිලිකරු හා විත්තිකරු | අපරාධ නඩුවක පාර්ශව - චෝදක හා චූදිත. |
| සිවිල් නඩු පවරන්නේ අගතියට පත් පාර්ශවය. | අපරාධ නඩු පවරන්නේ ආගතියට පත් පාර්ශවය වෙනුවට රජය විසින්.එම පාර්ශවය වෙනුවන් මහේස්ත්‍රාත් අධිකරණයේ දී පෝලීසියද, මහාධිකරණයේ දී නීතිපති වරයාද නඩුව මෙහෙයවයි. |
| සිවිල් නඩුවක ඔප්පු කිරීමේ භාරය ශක්යතා වැඩි බර මතයි. | අපරාධ නඩුවක් සාධාරණ සැකයෙන් ඔබ්බට ඔප්පු කල යුතුයි. |
| උදා - විවාහා නීතිය, ඉඩම් නීතිය, ගිවිසුම් නීතිය | උදා - මිනී මැරුම්, ස්ත්‍රී දූෂන, කොල්ල කැම්, පුරාවස්තු හානි. |

# හරයාත්මක නීතිය හා කර්යය පටිපාටික නීතිය

යම්කිසි වරදක් සම්බන්ධව අර්තනිරුපනයක් හා එම වරදට අදාල දඩුවම් දක්වා ඇත්තේ හරයාත්මක නීතිය තුලයි.

උදා - දණ්ඩ නීති සාංග්‍රහය.

යම් වරදක් සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ නඩු කටයුතු මෙහෙයවන්නේ කෙසේද ඒ සදහා වන පටිපාටිය කුමක්ද යන්න කර්ය පටිපාටික නීතිය තුලින් විග්‍රහා කරයි.

උදා - සිවිල් නඩු විධාන සංග්‍රහය

අපරාධ නඩු විධාන සංග්‍රහය

# දේශීය නීතිය හා අන්තර්ජාතික නීතිය

රටේ ව්‍යවස්ථාදායකය මගින් සකස් කරන ලබන නීතීන් **දේශීය නීති** ලෙස සරලව හඳුන්වයි. එලෙසම මෙය යම් සුවිශේෂි වූ භූමි ප්‍රදේශයකට පමණක් ආදාල නීතියකි.

රාජ්‍යයන් අතර බැදීම් ඇති කරගන්නා ආකාරයේ රීතින් සමුදායක් **අන්තර්ජාතික නීතිය** ලෙස හැදින්විය හැක.

නිදසුනක් ලෙස රටවල් අතර ඇති කර ගන්නා ගිවිසුම්, සම්මුතීන් දැක්විය හැක.

# පුද්ගල නීතිය හා පොදු නීතිය

පුද්ගල නීතිය ලෙස හඳුන්වන්නේ පුද්ගලයන් අතර පවතින්නා වූ ගැටුම් නිරාකරණයට අවශය ප්‍රතිපාදන සලස්වන නීති සමුදායයි.

**උදා - ගිවිසුම් නීතිය, පරිපාලන නීතිය, අපරාධ නීතිය.**

මහජනයාගේ ජීවිත වලට පොදුවේ බලපාන රජයත් ජනතාවත් අතර ඇති කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපාදන සලසන නීතිය පොදු නීතිය ලෙස සරලව අර්ත දැක්විය හැක.

**උදා - ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය, පරිපාලන නීතිය, අපරධ නීතිය**

# 1.1.2 නීති මූලාශ්‍ර

නීති ක්ෂේත්‍රය තුල නීති විශය ගවේශනය කරන්නන් හට විවිධ තීරණ වලට එලඹීමේදී විවිධ කරුණු අවබෝධ කර ගැනීමට යොදා ගන්නා මූලාශ්‍රයන් නීති මූලාශ්‍ර ලෙස හැදින් වේ. තවද කිසියම් වු නීතිමය රීතියක් බිහි වීමට බලපෑ මූලයන් මෙලෙස හදුන්වයි.

නීතියේ වැදගත් මූලාශ කිහිපයකි.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව
- ව්‍යවස්ථා
- අධිකරණ පූර්ව නිදර්ශන
- සිරිත් විරිත්
- නීතිවේදීන්ගේ මත
- සාධාරණත්වය
- ආගම

# 1. 2 ශ්‍රී ලංකාවේ බහුවිධ නීති පද්ධතිය

ශ්‍රී ලංකාව යනු බහු වාර්ගික ජන කොට්ඨාශයන් රාශියක් ජිවත් වන ඔවුන්ට ආවේනික විවිධ වූ සාංස්කෘතීන් පවතින රටකි. මේ අනුව ලාංකාවේ නීති පද්ධතිය තුලද විවිධ සාංස්කෘතීන් මත පදනම් වූ බහුවිධ නීති පද්ධතියක් දැක ගත හැක.

පහත නීති ක්‍රම ඒ තුලින් හදුනා ගත හැක.

- උඩරට නීතිය.
- තේසවලමේ නීතිය.
- මුස්ලිම් නීතිය.
- රෝම ලංදේසි නීතිය.
- ඉංග්‍රීසි නීතිය.

# 1.2.1 විශේෂ නීති හා පොදු නීති

යම් පුද්ගලයෙක්ට ජන කොට්ඨාසයකට බලපන නීති පද්ධතියක් විශේෂ නීති ලෙස හඳුන්වයි.

උදා : **01.** උඩරට නීතිය -

උඩරට නීතිය යනු ප්‍රදේශිය පදනමක් සහිත පුද්ගල නීතියකි. උඩරට ප්‍රදේශයේ පදිංචි පාරම්පරික සිංහලයන් අතර මෙම නිතිය පවතී.විවාහ දික්කසාද, තයාග ලබා දීම, දරුකමට හදා ගැනීම වැනි විශේෂ අවස්තා වලදී මෙම නීති සම්ප්‍රදාය යොදා ගනී

**02.** තේසවලාමේ නීතිය -

දකුණු ඉන්දියාවෙන් සංක්‍රමනය වූ යාපනය ප්‍රදේශයේ ජීවත් වන දමිල ජනතාව අතර මෙම නීති සම්ප්‍රදාය පවතී.මෙම නීතිය ප්‍රාදේශිය නීතියක් ලෙස එම ප්‍රදේශයේ පුද්ගලයින්ගේ දේපල සම්බන්ද නඩු වලදීද, පුද්ගල නීතියක් ලෙස විවාහ දික්කසද වලදී, පූර්වක්ක්‍ර අයිතියේදී, පවරශයතා, ඔට්ටි උගය අවස්තා වලදී ක්‍රියාත්මක වේ

## 03. මුස්ලිම් නීතිය,

ලංකාවේ වෙසෙන මුස්ලිම් ජනතාව අතර ගොඩනැගුනු නීතියක් ලෙස මෙය දැක්විය හැක. මුස්ලිම් වරුන්ගෙන් සමන්විත ක්වාති උසාවියක් මගින් නඩු අසීම් සිදු කරයි. උරුමය හා අනුප්පාතිය, විවාහය, දික්කසාදය, බලවයස්කරබව, භාරකාරිත්වය වැනු අවස්තා වල මෙම උසාවිය තුල නඩු කතා කිරිම සිදු කරයි.

***<u>පොදු නීති,</u>***

යම් රටක් තුල ජීවත් වන පුද්ගලයන් සියල්ලටම එක සේ එනම් ආගම, ජනවර්ගය ලෙස කිසිදු විශේෂ සැලකිල්ලක් සිදු නොකරමින් ක්‍රියත්මක වන නීති සම්ප්‍රදායයි.

- රෝම ලංදේසි නීතිය
- ඉංග්‍රිසි නීතිය

# රෝම ලංදේසි නීතිය

ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන ප්‍රධානම නීති ක්‍රමය මෙයයි. 1976 දී ඉංග්‍රීසින් අපේ රට යටත් කර ගැනීමේ ප්‍රතිපලයක් ලෙස මෙය අපිට ලැබුනි.එලෙසම ලංකාවේ ශේෂ නීතිය ලෙසද හදුන් වන්නේ රෝම ලංදේසි නීතියි.ඉංග්‍රිසි පාලන සමය තුල දී වැඩි වශයෙන් වාණිජ හා වෙළෙද කටයුතු සම්බන්ද නඩු වලදී රෝම ලංදේසි නීතිය යොදා ගත්  නමුත් වර්තමානය වන විට යම්යම් වෙසස්කම් වලට ලක් කරමින් බොහෝ නඩු සම්බන්ධයෙන් තීරණ ගැනීමෙදී මෙම ක්‍රමය අදාල කර ගනී.

රොම ලංදේසි නීතිය අදාල වන අවස්තා -

- ශිවිසුම් නීතිය
- දිලක්ත නීතිය
- නිශ්චල දේපල සම්බන්ධ නීතිය
- පවුල් නීතිය
- දික්කසාද නොවන අධිකරනමය වෙන්වීම් සදහා වන නීතිය
- මහලු දෙමාපියන් නඩත්තු සම්බන්ධ නීතිය

# 1. 3 ශ්‍රී ලාංකාවේ අධිකරණ පද්ධතිය

ශ්‍රී ලංකාවේ නීති පද්ධතියේ ආරම්භය සිංහල රජ සමය දක්වා අතීතයට දිවයන්නකි. ඉන් පසුව ලංකාව ආක්‍රමණය කල පෘතුගීසින්, ලන්දේසින්,ඉංග්‍රීසින් මෙම නීති පද්ධතියේ විධිමත් විකාශනයේ පුරෝගාමීන් විය.මේ අතරින් ලංදේසින් ශ්‍රී ලංකාවේ විධිමත් උසාවි ක්‍රමයක් පිහිටුවීමට උත්සහ දැරු අතර ඔවුන් සිවිල් රාද්, ලැන්ඩ් රාද්, රාද් වැන් ජස්ටිට් නමින් තුන් ආකාර අධිකරණ ලංකාව තුල පිහිටු විය.එය අධිකරණ ඉතිහාසය තුල වැදගත් සංදිස්තානයක් මෙන්ම අද පවතින අධිකරණ ධූරාවලිය පිහිටවීමේ මූලාරම්භයද විය.

ශ්‍රේෂ්ඨාධිකරණය

අභියාචනාධිකරණය

මහාධිකරණය

දිසා අධිකරණය

මහේස්ත්‍රාත් අධිකරණය

ප්‍රාථමික අධිකරණය

ඉහල අධිකරණ

1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇත

මූල් අවස්ථා අධිකරණ

1978 අංක 02 දරණ අධිකරණ සංවිධාන පනත අනුව පිහිටුවා ඇත.

# ශ්‍රේෂ්ඨාධිකරණය

ශ්‍රී ලංකාවේ උත්තරීතරම හා අවසාන අභියාචනාධිකරන බලය ඇති අධිකරණය ලෙස හදුන්වන්නේ ශ්‍රේෂ්ඨාධිකරනය යි. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවා ඇති මෙහි උපරිම විනිසුරුවන් 17කගෙන් සමන්විත සංයුතියක් 20 වන ව්‍යවස්ථා සංශෝදනයත් සමග පිහිටු විය.

ශ්‍රේෂ්ඨාධිකරණ බලතල.

- මූලික අයිතිවාසිකම් පිලිබද බලතල
- සිවිල් හා අපරාධ අධිකරණ බලතල
- විශේෂ රීට් ආඥා නිකුත් කිරීමේ බලය
- උපදේශනාත්මක බලය.
- ජනාධිපති පෙත්සම් විභාහග කිරීමේ බලතල

# අභියාචනාධිකරණය

තනි විනිසුරු හෝ තනි විනිසුරු සමග ජූරියක් සහිතව අභියාචනාධිකරනය තුල නඩු ඇසීම සිදු කරයි.උපරිමය 20 දක්වා වන විනිසුරු මඩුල්ලකගෙන් සමන්විත සංයුතියක් පවතින මෙහි බලතල පහත පරිදි වේ.

01. අභියාචනාධිකරණ බලය

02. රීට් ආඥා නිකුත් කිරීමේ බලය

- සර්ෂියොරාරි - පුද්ගල අයිතිවාසිකම් කඩවීම වැලැක්වීම
- ප්‍රොහිබිෂන් - ක්‍රියාවක් සිදු කිරීම තහනම් කිරීම
- ප්‍රොසිඩෙන්ඩෝ - ලංකාවේ ලබා නොලදේ. පහල අධිකරණ විනිසුරුවරයෙකුට නීතිය අනුව ක්‍රියා කිරිමට බලකරයි.
- මැන්ඩාමුස් - ජනතා සේවයක් ඉටු කිරීමට බලකිරීම
- ක්වෝ වොරන්ටෝ - රජයේ නිලධාරියෙකුට එම ධූරය දැරීමට ඇති අයිතිය ප්‍රශ්නකර එම ධූරය අහිමි කිරීමට හැකි රීට් ආඥාව.
- හේබියස් කෝපූස් - නීති විරෝධිව හෝ අනිසි ලෙස රජයේ හෝ පෞද්ගලික අත් අඩංගුවේ ඇති අයෙක්ව නීතියට අනුව කටයුතු කිරීම උදෙසා අධිකරණය කැදවන රීට් ආඥාව.

03. අධිකරණයට අපහස කිරීම සම්බන්ධ නඩු විභාග කිරීම

# මහාධිකරණය

## මහාධිකරණ බලතල

- මූලික අධිකරණ බලය.
- අභියාචනාධිකරණ බලය
- අධි චෝදනා ගොනු කිරීමේ බලය (නීතිපති හෝ අල්ලස් දූෂණ කොමිෂන් සභාවේ ජනරාල්වරයා විසින් සිදු කරයි.)
- අපරාධ නඩු විභාග කිරීම

මහාධිකරණය මෙන්ම නඩු විසදන තවත් ආයතන ද්විත්වයක් මේ යටතේම හදුන්වා දිය හැක.

**01. පළාත් බද මහාධිකරණය -**

13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝදනයත් සමගම පිහිටුවා ඇති මෙහි පළාත තුල සිදුවන නඩු මෙහෙයවීම කරයි. තවද පළාත තුල රිට් ආඥා නිකුත් කිරීමේ බලයද මෙය සතුයි.

**02. වාණිජ මහාධිකරණය -**

මිලියන 20කට වඩා වැඩි වටිනාකමක් සහිත මූල්‍යමය ආරවුල් විසදීම සිදුකරයි. කොලඹ සහ හෝමාගම දී වර්තමානයේ මෙය නඩු ඇසීමේ කටයුතු සිදු කරයි.

# දිසා අධිකරණය

මුල් අවස්ථා සිවිල් නඩු මෙම අධිකරණ තුලදී විභාග කෙරේ. **බෙදුම් නඩු, ඉඩම් නඩු, දික්කසාද, බූදල් නඩු,භාරකාරීත්ව නඩු,ගිවිසුම් කඩ කිරීම් සම්බන්ධ නඩු** දිසා අධිකරනයේ විභාග වන නඩු වලට නිදසුන් ලෙස දැක්විය හැක.

# මහේස්ත්‍රාත් අධිකරණය

පහල අපරාධ අධිකරණයක් ලෙස මෙය සරලව හැඳින්විය හැක.මහේස්ත්‍රාත්වරයෙක් විසින් නඩු මෙහෙයවනු ලබයි. පහත බලතල මහේස්ත්‍රාත් අධිකරණයක් සතු වේ

සුළු අපරාධ නඩු මෙහෙය වීම
ලඝු නොවන පරීක්ෂණ පැවැත්වීම
වරෙන්තු නිකුත් කිරීම
හදිසි මරණ පරීක්ෂන පැවැත්වීම.

# සෙසු පරිපාලන විනිශ්චය සභා

ඉහත සදහන් කරන ලද අධිකරණ පෙරාවලියට අමතරව පහත දැක්වෙන පරිපාලන විනිශ්චය සභා ක්‍රියාත්මක වේ.

- කුලී මණ්ඩල කම්කරු විනිශ්චය සභා
- කෘෂිකර්ම විනිශ්චය සභා
- කාර්මික උසාවි
- ඉඩම් අත්පත් කර ගැනීමේ මණ්ඩල
- සමථ මණ්ඩලය (රු. 500000 කට අඩු නඩු විභාග කරයි )

# නියාමන ආයතන වල කාර්යභාරය

ව්‍යාපාර ස්ථාවරව ක්‍රමානුකූලව ක්‍රියාත්මක වීමට පනවන ලද සුවිශේෂී රෙගුලාසි බලාත්මක හා ක්‍රියාත්මක කරවීම සඳහා නියාමනය කිරීමේ ආයතන නිර්මාණය කර ඇත. මෙරට වාණිජ ක්ෂේත්‍රය තුල ව්‍යාපාර හා මූල්‍ය කටයුතු විධිමත් ලෙසත් නීත්‍යානුකූල ලෙසත් පාලනය කිරීම පිණිස ස්ථාපිත කරන ලද නියාමන ආයතන කිහිපයක් පහත දැක්වේ.

**01.**ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනය

1959 අංක 23 දරණ පාර්ලිමේන්තු පනත ප්‍රකාරව පිහිට වූ මෙහි කාර්යයන් කිහිපයක් පහත පරිදි වේ. මූල්‍ය ක්‍රමයන්ගේ හා අයවැයහි අඛණ්ඩ කළමණාකරණය

- මූල්‍ය විගණනය කිරීම
- සේවා දායකයන් සමග ගනුදෙනු කිරීම
- මූල්‍ය තොරතුරු හා උපදෙස් දීම ගිණුම්කරණ
- නීති පිළිබඳ උපදෙස් දීම.

02.ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණකාධිකරණ ප්‍රමිතීන් නියාමනය හා අධීක්ෂණ මණ්ඩලය

03.සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව

04.කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුව -

ලැයිස්තුගත සමාගම්හි කොටස් හුවමාරු කිරීම හා පරිපාලනය කරන ආයතනය මෙයයි. මෙහි කාර්යයන් වනුයේ,

- කොටස් හුවමාරුව සඳහා පහසුකම් සැලසීම
- පොදු සමාගම් මිලකල සමාගම් වශයෙන් නියාමනය කිරීම
- ලේඛනගත පුවරු පවත්වාගෙන යාම
- සීමා සහිත මධ්‍යම තැන්පතු හුවමාරුව පවත්වාගෙන යාම
- ආයොජකයන්ට අවශ්‍ය දැනුම ලබා දීම

**05.** ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය -

දේශීය මෙන්ම විදේශීය ආයොජකයන් සදහා පහසුකම් සපයන කේන්ද්‍රීය ආයතනය මෙයයි. මූලිකවම ආයොජන මණ්ඩලය මහකොළඹ ආර්ථික කොමිසම ලෙස හදුන්වයි.

**06.**ශ්‍රී ලංකා මහ බැංකුව -

1950 වර්ශයෙදී ආරම්භ කර ඇති මෙය ශ්‍රී ලංකාවේ ආර්ථික හා මිල ස්ථායිතාව පවත්වාගෙන යන මූලිකම ආයතනයයි.අනෙක් අතින් මූල්‍ය ක්‍රමයේ ස්ථායිතාව පවත්වා ගෙන යාම තුලින් ආයෝජකයන්ට හිතකර පරිසරයක් නිර්මාණය කරමින් රටේ ස්ථායිතාව පවත්වාගෙන යන මහ බැංකුව රටේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රීය ආයතනයයි.

**07.**සමාගම් රෙජිස්ටාර්

*THANK YOU*